

# අංකොටාගෙ මොළෙ

පෙත්මි රනුල්යා රණසිංහ බණ්ඩාර

# අංකොටාගෙ මොළෙ

පෙත්මි රනුල්‍යා රණසිංහ බණ්ඩාර

ප්‍රථම මුද්‍රණය 2025 පෙබරවාරි 08

කතෘ ප්‍රකාශනයකි
කතාව සහ චිත්‍ර - පෙත්මි රනුල්යා රණසිංහ බණ්ඩාර

කතෘගේ ලිපිනය -
නො. ඒ/30, ජයසෙවණ උද්‍යානය, කුණ්ඩසාලේ

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර
ශ්‍රේණිය - 5 ශ්‍රේණිය E

පරිගණක අක්ෂර සහ පිටු සැකසුම -
Champa Digital Colour Lab, Kandy

ISBN : 978-624-208-812-9

# පිදුම

මගේ ආදරණීය මහාමායා මවට
තිලකරත්න ගුරු පියාණන් හට,
මගේ දෙමව්පියන් හා අත්තම්මා
සහ
මගෙ යහළු යෙහෙළියන් වෙත
ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ගමරාලගේ හරක් පට්ටියේ සිටින අංකොටා ගමේ කවුරුත් හොඳට හඳුනනවා. ඌ කුඩා කාලයේ එහෙ මෙහෙ දුව පනිමින් සිටින අතර, ගස් බෙනයකට ඔළුව දාලා ළපටි අඟක් කඩා ගත්තා. දැන් එයාට ඒ නිසා තියෙන්නේ එක අඟක භාගයයි. කවුරුත් එයාට කිවුවේ අං කොටා කියලා. ඌ තමයි ගම රාලගේ හුරතලා. හැබැයි කුඹුරු හාන්න පටන් ගත්තම අං කොටා එක දිගටම වැඩ කරනවා. උගේ ඇස් දෙක හරිම දිප්තිමත්. ඌ නිතරම හිටගෙන ඉන්නේ කය සමබර කරගෙන. අංකොටා හරිම තේජස් පාටයි.



හවස හරක් කොටුවට ආ විට ඌ නිදා ගන්නේ කොටුව ඇතුලේ පිටුපස කොනේ. එළිවන විට අංකොටාට හරි බඩගිනියි. උදේ ගමරාල දොරටුව අරිනවත් සමඟම සියලුම හරකුන්ට උඩින් පැන එළියටම පනිනවා. දොරටුව ළඟ ඉන්න ගමරාල ඉදිරියේ පිනුමක් ගහනවා. වලිගය උස්සලා කරකවනවා. ඔළුව පාත් කරලා කඳ දෙකට නමලා නැටුමක් වගේ ගස්සලා දෙතුන් සැරයක් උඩ පනිනවා. ඊළඟට සෙල්ලමක් මෙන් ළපටි දළු කමින් හැල්මේ දුවනවා. මේ නිසා සමහර විට අං කොටාට කෝටු පාර දෙක තුනක් ද වදිනවා. ඒත් රිදෙන්ට නොවේ ආදරේට.

දවසක් බඩගින්නේ අං කොට නිදිවරා සිටියා. ගමරාල දොරටුව විවෘත කරනවාත් සමඟම එළියට පැන්නා. සුපුරුදු රංගනය ඉදිරිපත් කළා. ගමරාලගේ ඇගේ හැපිලා කොටුපාර දෙක තුනක් ද කෑවා. උඩ පනිමින්, වලිගය වකුටු කර නමමින්, හිස වනමින්, අංකොටා පාර දිගේ දිවුවා. එදා හොඳට හිරු පායා තිබුණා. දීප්තිමත් ආලෝකයකින් ප්‍රදේශයම ඒකාලෝක වෙලා. වැල් ගාලවල් අස්සේ රූස්ස ගස් අස්සේ පවා හිරු එළිය පැතිරිලා. හරිත වර්ණ ළපටි දළු වලින් හැම තැනම ලස්සන වෙලා. අංකොටාට හිතෙනවා, ඒවා කාගෙන කාගෙන යන්න. ඌ එහෙම කළා. දැන් බඩ පිරිලා.

“මොකක්ද ඔය ඇහෙන්නේ? සිලි සිලි සද්දයක් නේද?” ඌ ඉව අල්ල අල්ලා විපරම් කරනවා. “ෂාහ්! මරු දිය පාරක්. නිල්පාටින් වතුර ගලනවා. මේක දෙගොඩ තලා යන ඇළක්.”ඌ දිව දාලා පරීක්ෂා කළා. අපුරුයි! බීගෙන බීගෙන යන්න පුළුවන්. එහෙම හිතලා බඩ පිරෙන්න වතුර බිවුවා. අංකොටාට හරි සතුටුයි.

අංකොටාට යාළුවෝ මතක් වුණා. ටිකක් දුක හිතුණා. වටපිට බැලුවා. වැල් ගාලයි, මුකලානයි හැර වෙන කිසිවක් පේන්න නෑ. ඌගේ යාළුවෝ අතුරු පාරකින් හැරිලා ගිහින් බව ඌ දන්නේ නෑ. “යාළුවන් එනතුරු මට තව ඇවිදින්න පුළුවන්.” එහෙම හිත හිතා වැල් ගාලේ ඉස්සරහට ගියා. වැල් කෑලි අතුකෑලි ඇඟේ පැටලුණා. අඟේත් පැටළුණා. කකුල් වලත් පැටළුණා. ඔළුව කරකවලා අංකොටේ හොලවලා සමහර වැල් කඩා ගත්තත්, සමහර තැන් වලදී ඌ හොඳටම හිර වුණා. උගේ දැගලිල්ල නිසා කුරුලු රංචු කීචි බීචි ගාමින් ඌ වටා ඉගිලෙමින් කිණිතුල්ලන් හා මැක්කන් කෑවා. මේ නිසා අංකොටාට හරි සනීපයක් දැනුණා. වැල් පැටළුම් බුරුල් කර ගන්නත් පහසු වුණා. කොහොම හරි වැල් කඩාගෙන වැල් ගාලෙන් එළියට ආවා.



නැවතත් උගේ පරිසර ගවේශණය ආරම්භ කළා. කල්පනාවෙන් වටපිට බැලුවා. "මොකක්ද අර තියෙන්නේ? හ්ම්! මහා තඩි ගල් පර්වතයක්. ඒකට දොරටුවකුත් තියෙනවා." ළගට ගියා. "ඒක ගල් ගුහාවක් නේ. ඒක මට පෙණුනේ හොඳ වෙලාවට. වැල් කෑළි, කෝටු කෑළි, ඉපල් ඇගේ තැන් තැන් වල ඇනිලා මට හරිම අමාරුයි. කකුලත් උළුක් වෙලා ඇදුම් දෙනවා. මේ වෙලාවට වෙනදා ගමරාල නම් අපිට කන්න දෙන්නේ ගොනිකා කියන ඖෂධ වැල්." ගල් ගුහාව වටේ අමාරුවෙන් ඇවිදින කොට ගොනිකා වැලක් අං කොටාට පෙනුණා. ඇති වෙනකන් ගොනිකා කොළ කෑවා. දැන් මට ඕනි ටිකක් හාන්සි වෙන්න.

ගල් ගුහාවේ දොරෙන් ඇතුළට ඔළුව දාල බැලුවා. නරි ගඳක් හා කොටි ගඳක් දැනුණා. හොඳටම බය හිතුනා. අඩි දෙක තුනක් ආ පස්සට ආවා. ටිකක් කල්පනා කළා. "මේක දවස් ගානක් පරණ ගඳක්. ඊයේ පෙරේදා නම් නරියාවත්, කොටියාවත් ඉඳලා නෑ." තමන්ටම කියා ගත්ත අංකොටා ගල් ගුහාවට ඇතුල්වෙලා, රවුම් දෙක තුනක් ගියා. ගුහාවේ ඈත කෙලවරේ කවුළුවකින් ඈත පේනවා. එළියත් වැටෙනවා. ටිකක් විවේක ගන්න ඉතා හොඳ තැනක් කියා ඌ බිම වැතිරුණා. ගමරාල මතක් වුණා. හැමදාම ලැබෙන පුන්නක්කු බාල්දියත් මතක් වුණා. ඔහොම ඉන්න කොට ඌට නොදැනීම නින්ද ගියා.

ඌ ඇහැරල බලනකොට හොඳටම දවල් වෙලා. බඩත්ගිනියි. ඌ ඉන්නේ හරක් කොටුවේ නොවන බව දැනුණා. හරි කම්මැලියි. ඈනුම් ඇර ඇර ගුහාව වටේ බැලුවා. පුරුදු වැල් ගාල හැර එළියට යන්න පාරක් පෙනෙන්නේ නෑ. එක පාරටම ගස් අතරින් කවුදෝ එබිකම් කරනවා දැනුණා. අංකොටාට උගේ ඇස් දෙක විශ්වාසයි. හොඳට වටපිට බැලුවා. ඒ නරියා බව හඳුනා ගත්තා. "මට ලේසි වෙන්නේ නෑ. ලොකු කරදරයක් අත ළඟම" අංකොටාට හිතුනා. නරියා එබිකම් කර, කර, අංකොටාගේ හැඩරුව බැලුවා. "අම්මෝ ! මෙහෙමත් පෘෂ්ටිමත් ශරීරයක්. තෙල් බේරෙන, මස් කඳක්. මූ මරා ගත්තෝත් තෙල් බේරෙන මෙලක් මස් කෑල්ලක රස බලන්න පුළුවන්. හැබැයි මරා ගන්න එක නම් එච්චර ලේසි නෑ. අනිත් අතට මූට මං පාඩමක් ඉගැන්නුවේ නැත්තම් ඌ මට පාඩමක් උගන්නනවා. මූට හොඳ ගේමක් දෙන්ට ඕනෑ. මටම තමා ඒක කරන්න වෙන්නේ."



මේකට උපායක් කල්පනා කරමින් නරියා කොටියාව හම්බවෙන්න ගියා. කොටියාට ආචාර කරලා, "මං ආවේ ඔබතුමාට හොඳ පණිවිඩයක් අරන්. " යැයි කිවුවා. කොටියා මුරුංගා අත්තේ තිබ්බොත් තමාටත් මස් කෑල්ලක් කන්න පුළුවන් බව නරියා දන්නවා. "මං වගේ කපටි නරියෙකුට මේ මෝඩ කොටියා පොළඹවා ගන්නා එක කජ්ජක් දැයි ඌටම කියා ගත්තා. " නරියා ආපසු කොටියාට දොහොත් මුදුන් දී වැන්දා. " ඔබතුමා හරි ජව සම්පන්නයි. තේජවන්තයි. හරිම ශක්තිමත්. ඒ වගේම තරුණයි. සිංහයෙක් නැති මේ මුකලානේ ඔබ වහන්සේ තමා රජා. ඔබ තරම් තේජවන්ත උත්තමයෙක් මේ අසල කැලෑවකවත් නෑ. වරක් දෙකක් ගොරවලා නියපොතු උල් කර ගෙන ඇඟිලි වකුටු කර ගෙන එක සැරයයි ඔබතුමා පනින්නේ. සතුරා ඉවරෙටම ඉවරයි. පොඩි කාලයේ වත් ඔබතුමාගේ කුරුමාණමක් වැරදිලා නෑ. ඔබතුමාගේ තාවකාලික නවාතැනේ දැන් ඉන්නේ අං කැඩිච්ච මී හරකෙක්. ඒත් ඌ තරුණයි. ඌ මරා ගත්තොත් තෙල් බේරෙන හොඳ මෙලෙක් මස් කෑල්ලක් කන්න පුළුවන්. ඌ දැක්කම කටට කෙල උනනවා. කොට අං නිසා ඌට ලොකු හපංකමක් කරන්නත් බෑ. ඒ වගේම තාවකාලික උනත් ඔබතුමාගේ වාසස්ථානයක් තමා ගල් ගුහාව. ඒකේ මේ මී හරකෙකුට ඉන්න දෙන්න පුළුවන්ද? ගොම දාල ගල් ගුහාව ගඳ ගැස්සුවොත් හදිස්සියකටවත් ඒකේ ඉන්න බෑ.." නරියා කියාගෙන යනවා.

කොටියා ආඩම්බර කමෙන් හා කෑදර කමෙන් මත්වුනා. කොටියා නැගිට්ටා. හනික යමු, හනික යමු, කියමින් කොටියා ගමන ආරම්භ කළා. අං කොටාද නරියා දුටු මොහොතේ සිටම අනතුරක් අපේක්ෂාවෙන් අවදියෙන් සිටියා. ගතවන සෑම මොහොතමක උෟ තමාට මුහුණපාන්න සිදුවන අනතුරු වලට විකල්ප යෝජනා කරමින් සිටියා.

මේ අතර අං කොටා නරියයි, කොටියයි ඈතින් එන බව කවුළුවෙන් දැක්කා. උගේ ඇඟ හිරිවැටුනා, මයිල් කෙලින් උණා. ගොම විසි උණා. කකුල් හතර අප්‍රාණිකව දඩස් ගාලා බිම වැටුණා. දැන් උෟ හතර ගාතේ දාලා බිම. "අනේ අංකොටෝ හිතට ධෛර්යය ගනින්. නැත්තම් උඹ කම්මුතුයි. නැගිටපන්, නැගිටපන්, ඔහොම බය වෙලා බෑ. හැමදාම හොඳට ළපටි දළු කාලා පුන්නක්කු බීලා මඩ වලවල් වල ලැගලා, හදා ගත්ත උඹේ ශක්තිය දැන් උරගා බලාපන්." උගේ හිත කිවුවා. අංකොටා හිතට ධෛර්යය අරගෙන නැගිට්ටා. දැං අංකොටාගේ මූණ හරි රෞද්‍රයි. නරියා අංකොටා දැක්ක ගමන් පසු පසට ඇදුනා. අංකොටා නරියාවත්, කොටියාවත්, ගනන් ගත්තේ නෑ. ගල් ගුහාවේ ඇතුළු පැත්තට හැරිලා හමුදාවේ අණදෙන නිලධාරියෙක් වගේ මෙහෙම කිවුවා. " නරි බල්ලෝ තෝ ඔය අපිට පොරොන්දු වෙච්ච හැටිද. අපි කිවුවේ කොටි පවුලම ගේන්න කියලා නේද? අපේ පුංචි පැටියා අල්ල ගත්ත කොටි නාම්බා වගේම උන්ගේ පවුලෙන්ම වාඩුව ගන්න ඕන. ඔය කොටි මාල්ලා තියලා අනිත් එවුමුත් ඇදගෙන වර...... "අංකොටා කියාගෙන ගියා.

මෙය ඇහුන කොටියා තරහ ගිය මී හරක් රංචුවකගේ හැටි දන්න නිසා නරියා දිහාට පැන්නා. නරියා හොඳටම බය වෙලා කළ හොඳ පස්සෙන් කියලා කකුල් වලට වැඳ වැඳ දුවන්න පටන් ගත්තා. කොටියා තමාව රවට්ටපු නරියා පස්සෙන් පන්නන්න ගත්තා. අංකොටාගේ උපාය නොදත් කොටියා තව මොහොතකින් හොඳ ශක්තිමත් මී හරක් රංචවුවක් තමා වටකොට පහරදෙනු ඇතැයි සිතා. කොටියා වේගයෙන් දුවන්න පටන් ගත්තා. කොටියා දුවන වේගය අනුව, ඌ නැවතත් නොඑන බව අංකොටාට තහවුරු උනා. ඌ සැනසුම් සුසුමක් හෙළුවා. "ඒ ප්‍රශ්ණය නම් ඉවරයි. මේ වගේ හැමදාම මගේ ආරක්ෂාව මටම සලසගන්න පුළුවන් දැයි ඌ සිතුවා.

මේ අතර කීප දෙනෙකු ඇවිදින ශබ්දයක් ඇහුණා. අංකොටා බලන කොට ගමරාලයි ගමේ කට්ටියි. "මේ ඉන්නේ මගේ පුතා උඹ ලොකු මාරකයකින් බේරිලා තියෙන්නේ. දැන් ගෙදර යමන්." ගමරාල කිවුවා. අංකොටා ඉස්සර වෙලා වෙනදා වගේ උඩ පනිමින් නොව බොහොම කල්පනාවෙන් හිස බිමට පහත් කර ගෙන ගමන ආරම්භ කළා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්